තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය.

**ජී.පී.අමරසේකර එ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය) 210/2017 (2018.02.01 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය)**

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.**

**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ය නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර මිය

**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - ජී.පී.අමරසේකර මයා
**නොතීසිලත්පාර්ශවය** - ගාමිණී සෙනෙවිරත්න මහතා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.07.28 |
| **තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.08.22 |
| **නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.08.25 |
| **නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | ප්‍රතිචාරයක් නොමැත. |
| RTIC **කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.09.19 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**
අභියාචක 2017.07.28 දිනැති ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *2013.01.11 දින නිකුත් කරන ලද ගැසට් නිවේදනයට අනුව රජයේ විද්‍යාත්මක සේවයේ ii වන පන්තියේ ii වන ශ්‍රේණියේ බඳවා ගැනීම් විභාගයේ ප්‍රතිපල අභියාචක හට නිකුත් කිරීමට කටයුතු නොකළේ මන්ද?*
2. සම්මුඛ පරීක්ෂණයෙදී රාජ්‍ය සේවා කොමිසම ලකුණු ලබා දෙන පටිපාටියට අනුව මාහට (අභියාචකහට) පහසුවෙන්ම අඩු ලකුණු ප්‍රමාණය ඉක්මවා යා හැකිය. එවැනි තත්වයක් තිබියදී අභියාචකගේ ලකුණු නිකුත් නොකර අභියාචක සම්මුඛ පරීක්ෂණයට නොකැඳවා උක්ත තනතුරට බඳවා නොගත්තේ මන්ද?
3. රාජ්‍ය සේවා කොමිසම පිහිටවීමේ අරමුණට පටහැනිව උත්තරීතර පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවේ නිර්දේෂණයන් නොසලකා හැරියේ මන්ද?
4. මේ සියලු ක්‍රියා නිසා මාගේ මානව හිමිකම් උල්ලංගනය වී ඇතැයි මට හැගේ. ඒ සඳහා රාජ්‍ය සේවා කොමිසම ලබාදෙන සහනය කුමක්ද?"

තොරතුරු නිලධාරියා 2017.08.22 දිනැතිව ප්‍රතිචාර දෙමින් 2017.03.04 දිනැතිව පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව වෙත යොමු කළ වාර්තාවෙහි පිටපතක් අභියාචකහට ලබාදී ඇත.

අභියාචක 2017.08.25දිනැතිව සිය තොරතුරු ඉල්ලීමෙහි අයිත්තම් 4ක්  යටතේ තොරතුරු විමසා ඇති බව පෙන්වා දක්වමින් 'සම්පූර්ණ නොවූ, නොමග යවන හා සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම' පාදක කරගෙන නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරියාගෙන් ප්‍රතිචාරයක් නොලැබීම හේතුවෙන් අභියාචක 2017.09.19 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමුකර ඇත.

**අභියාචනය විභාග කිරීමේ අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**
කොමිෂන් සභාවේ නොතීසි වලට ප්‍රතිචාර දක්වමින්, අභියාචක 2018.01.25 දිනැතිව ලිඛිත දේශනා ගොනු කර ඇතත්, පොදු අධිකාරිය  කරුණු දැක්වීමට අපොහොසත් වී ඇත.

**නියෝගය:**
මෙම තොරතුරු ඉල්ලීම පොදු අධිකාරිය ප්‍රකාශිතව ප්‍රතික්ෂේප කර නොමැති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.
පොදු අධිකාරිය ලිඛිත දේශනා ගොනු කිරීමට අපොහොසත් වී ඇති බැවින්, වැඩිදුර කරුණු සළකා බැලීමට අභියාචනා වාරය කල් තබනු ලැබේ.

*ඊළඟ විභාග වාරය :* 05.04.2018

****

**RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය) 210/2017 (2018.04.05 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය)**

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම  පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.**

| | | |
|---|---|---|
| **සභාපති** | - | මහින්ද ගම්මම්පිල මහතා |
| **කොමිෂන් සභා සාමාජික** | - | ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා |
| **කොමිෂන් සභා සාමාජික** | - | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර මිය |
| **අධ්‍යක්ෂ-ජනරාල්** | - | පියතිස්සරණසිංහ |

| | | |
|---|---|---|
| **අභියාචක** | - | ජී.පී.අමරසේකර මයා |
| **නොතීසිලත්පාර්ශවය** | - | ගාමිණී සෙනෙවිරත්න මහතා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව. |

**නියෝගය:**

මෙම අවස්ථාවේදී කරුණු සලකා බලීම්දී පෙනී යන්නේ අභියාචක විසින් 2017.07.28 දිනැති ඉල්ලීම මගින් විමසා ඇති තොරතුරු, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 43 වගන්තියෙහි අර්ථනිරූපණය ප්‍රකාරව ලබා දිය හැකි තොරතුරු නොවන බවයි..
පනතෙහි 43 වගන්තිය ප්‍රකාරව තොරතුරු යන අර්ථනිරූපණයට ඇතුලත් ඉල්ලීම් යොමු කිරීමට කටයුතු කරන ලෙස අවධාරනය කරමින් පනතේ 43 වැනි වගන්තිය කෙරෙහි අභියාචකගේ අවධානය යොමු කරනු ලැබේ.

43 වගන්තිය:

> *"තොරතුරු" යන්නට පහත සඳහන් ඒවායේ භෞතික ස්වරූපය හෝ ස්වභාවය නොසලකා, සටහන්, ලේඛන, සංදේශ, විද්‍යුත් තැපැල්, මත, උපදේශ, මාධ්‍ය නිවේදන, චක්‍රලේඛ, නියම, ලොග් පොත්, ගිවිසුම්, වාර්තා, ප්‍රවෘත්ති පත්‍ර, සාම්පල්, ආදර්ශක, හුවමාරු වන ලිපි, සංදේශ, නීති කෙටුම්පත්, පොත්, පිඹුරු, සිතියම්, චිත්‍ර, රූප සටහන්, රූප හෝ ප්‍රස්තාරාමය වැඩ හෝ ඡායාරූප, සේයාපට, ක්ෂුද්‍ර සේයාපට, ශබ්ද පටිගත කිරීම්, වීඩියෝ පට, යන්ත්‍ර මඟින් කියැවිය හැකි වාර්තා, පරිගණක වාර්තා සහ වෙනත් ලේඛනගත ද්‍රව්‍ය, ඇතුළු යම් ආකාරයකින් ලේඛනගත කරන ද්‍රව්‍ය සහ ඒවායේ යම් පිටපත් ඇතුලත් වේ.*

අභියාචනය මෙයින් අවසන් කරනු ලැබේ.

****